WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

**සංගීතය (පෙරදිග) I, II**
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) 'නි̣සගුම ධුප' ස්වර සංගතිය යෙදෙන රාගයෙහි ජාතිය නම් කරන්න.

(ii) යමන් රාගයෙහි යෙදෙන මධ්‍යම ස්වරය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(iii) ඛලි ස්ථානය හයවන මාත්‍රාවෙහි යෙදෙන තාලය නම් කරන්න.

(iv) ඛ්‍යාල් ගායනා සඳහා යොදාගනු ලබන තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

● අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්නවල දී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) සත්‍යජිත් රායිගේ පාතර් පංචාලි චිත්‍රපටයට පසුබිම් සංගීතය නිර්මාණය කරන ලද්දේ .................. විසිනි.

(vi) 'ගැඹුරු සත් සමුදුර පතුල බිඳ' යන ගී පාදය සඳහා වැයීමට සුදුසු හින්දුස්ථානි තාලය ...................... ලෙස හැඳින්වේ.

(vii) විශාරද නන්දා මාලනී විසින් ගයන 'අම්මාවරුනේ' ගීතයෙහි තනුව නිර්මාණය කර සංගීතවත් කරන ලද්දේ ......................................... සූරීන් විසිනි.

(viii) 'නෙයිනගෙ සුදුව' නාට්‍යමය ජවනිකාව ඇතුළත් වන්නේ ................................. නාට්‍යයෙහි ය.

● ප්‍රශ්න අංක (ix) සහ (x) හි හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු වරහන් තුළින් තෝරා ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(උරුට්ටුව, කපිරිඤ්ඤා, නූර්ති, $6_8$, $4_4$)

(ix) ................................. ගීත සම්ප්‍රදාය ඇසුරු කරමින් නිර්මාණය වූ 'රස ආහර කවලා - රන් කුඩුවේ දමලා' යන සිංහල ගීතය ................................. රිද්මය මුල්කරගෙන නිර්මාණය වී ඇත.

(x) ................................. ගීතයක තාලයෙන් තොරව ගැයෙන කොටස දොහොරාව වන අතර නාඩගම් ගීතයක ද්‍රැත ලයෙන් ගැයෙන කොටස ........................ වේ.

**2.** පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩ කිහිපයකි.

A - ගප, ධනි, සරිස

B - ගප, නිධ, නිරිස

C - ගප, ධධ, සරිස

(i) ඉහත A, B, C හි දැක්වෙන ස්වර ඛණ්ඩවලට අයත් වන රාග පිළිවෙළින් නම් කරන්න.

(ii) එම රාග තුනට අදාළව මධ්‍යම ස්වරයෙහි සුවිශේෂීතාවය වෙන වෙනම රාග නාමය ඉදිරියෙන් ලියන්න.

(iii) ඉහත A, B, C කොටස්වලින් පිළිබිඹු වන කල්‍යාණ මේලගත රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටසක් තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

3. නිර්දේශිත රාග තුනක් හඳුනා ගැනීම සඳහා උපකාරී වන තොරතුරු දෙකක් පහත දැක්වේ.

A - කල්‍යාණ මේලගත නිර්දේශිත රාග දෙකකි.

B - ශුද්ධ ස්වර පමණක් යෙදෙන නිර්දේශිත රාග දෙකකි.

(i) ඉහත තොරතුරු මගින් පිළිබිඹු වන රාග **තුන** නම් කරන්න.

(ii) එම රාග තුනෙන් කැමති රාගයකට අනුව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර **දෙකක්** ලියන්න.

(iii) කෝමල ස්වර සහිත නිර්දේශිත රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ අන්තරා කොටසක් ස්වර ප්‍රස්තාර කරන්න.

(iv) දීප්චන්දි තාලය නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න.

4. (i) බැති ගී සහ කෙළි ගී යන ගී වර්ග **දෙක** පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ii) තුන්සරණේ ගී, ඔළිඳ කෙළිය යන ගී වර්ග දෙකේ සමානතා **දෙකක්** හා අසමානතා **දෙකක්** ලියා දක්වන්න.

(iii) සෙත් ගීවල විශේෂ ලක්ෂණ **හතරක්** ලියන්න.

(iv) ගුත්තිල කාව්‍යයේ එන, දොළොස්මත් පැදියක මුල්පාද දෙකේ වචන පමණක් ප්‍රස්තාර කරන්න.

5. පහත වගුවෙහි A, B, C හා D යන තීරුවලින් දැක්වෙන්නේ ලංකාවේ ප්‍රචලිත නාට්‍ය ගීත හතරක මුල් පාද ය.

| A | B | C | D |
|---|---|---|---|
| මෙමගින් ගිය රුසිරු එ තරුණා | ප්‍රේමයෙන් මන රංජිත වේ, නන්දිත වේ | වගුරට නරනිඳු දඹදිව පරසිඳු | ආලේ බැන්ද මාගේ රම්‍යවන් |

(i) ඉහත ගීත අතුරෙන් තුනක් නවනාට්‍ය ශෛලියට අයත් වේ. අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග එම නවනාට්‍ය **තුනෙහි** නම් ලියන්න.

(ii) A තීරුවෙහි සඳහන් ගීතය අයත් වන නාට්‍ය ශෛලියේ සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න.

(iii) B හා C තීරුවල සඳහන් ගී පාද තලානුකූලව ප්‍රස්තාර කරන්න.

(iv) D තීරුවෙහි සඳහන් නාට්‍ය ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

(ආ) එම ගීතය ගයනු ලබන නාට්‍යයෙහි එන චරිත නාමය ලියන්න.

(ඇ) එම ගීතයේ තාලයට ගැළපෙන හින්දුස්තානි තාලය නම් කරන්න.

6. පහත දැක්වෙනුයේ අපරදිග ස්වර ප්‍රස්තාරයකින් උපුටාගත් කොටසකි.




WWW.OLEVELAPI.COM

(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ස්වර ප්‍රස්තාර කරන්න.

(ii) පෙරදිග ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන ලද ස්වර ප්‍රස්තාරයේ පළමු විභාග හතරට අයත් ස්වර, මධ්‍යම භාවයට පෙරළා නැවත ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත ස්වර ප්‍රස්තාරයේ a, b, c, d වශයෙන් ලකුණු කොට ඇති අපරදිග ස්වර සංකේත සඳහා භාවිත නාමයන් ලියා දක්වන්න.

(iv) ඉහත ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන ටයිම් සිග්නේචරයට (time signature) ගැළපෙන දේශීය 'තිත' නම් කර, බෙර පදය ප්‍රස්තාර කරන්න.

7. පහත සඳහන් කරුණු අතුරෙන් **තුනක්** පිළිබඳ ව උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න.

(i) ග්‍රැමෆෝන් යුගයේ ජනප්‍රිය වූ ස්වාධීන ගී හා ගායක ගායිකාවන්

(ii) සී. ද. එස් කුලතිලක සූරීන් විසින් සිදු කරන ලද සංගීතමය සේවාව

(iii) නූර්ති ගීතවල රාගධාරී පසුබිම

(iv) සිංහල චිත්‍රපට ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ගත් 'රේඛාව' චිත්‍රපටය

(v) බටහිර සංගීතඥ මොසාර්ට් විසින් සංගීතයට සිදු කළ සේවාව

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...